# XVI පරිච්ඡේදය

## දේශපාලන අයිතිවාසිකම් සහ සමාගම් පැවැත්වීමේ අයිතිය

1. දේශපාලන අයිතිවාසිකම් භුක්ති විඳීම
2. ජනාධිපති ධුරයට, පාර්ලිමේන්තු මන්ත්‍රී ධුරයකට, පළාත් සභා හෝ පළාත් පාලන මන්ත්‍රී ධුරයකට තෝරා පත් කර ගැනීමට සුදුසුකම් නොලබන තැනැත්තන්
3. දේශපාලන රැස්වීම් සහ ජන්ද ආයාචනයෙහි යෙදීම (Canvasing ) ආදිය
4. පිළිගත් දේශපාලන පක්ෂයක මධ්‍යම කාරක සභාවන්හි නිලතල උසුලන තැනැත්තන්ගේ මාරුකිරීම් වලදී ලබා දෙන අනුග්‍රහ
5. දේශපාලන පක්ෂයක සාමාජිකත්වය
6. වෘත්තීය සංගම්වල සාමාජිකත්වය

# XVI පරිච්ඡේදය

## දේශපාලන අයිතිවාසිකම් සහ සමාගම් පැවැත්වීමේ අයිතිය

## 1. දේශපාලන අයිතිවාසිකම් භුක්ති විඳීම

රාජ්‍ය සේවයෙන් හෝ පළාත් පාලන සේවයෙන් යම් උසස් අධ්‍යාපන ආයතනයකට/ විද්‍යායතනයකට ද්විතීයන පදනම මත සේවයට පැමිණි තැනැත්තන් හැර, කොමිෂන් සභාවේ/ උසස් අධ්‍යාපන ආයතනයක/ විද්‍යායතනයක සේවයේ නියුතු සියලුම තැනැත්තන්, මෙහි පහත 1.2.3 සහ 1.3 උපඡේදයන්හි සඳහන් ව්‍යාතිරේකයන්ට යටත් ව, ශ්‍රී ලංකාවේ පුරවැසියන් ලෙස, දේශපාලන අයිතිවාසිකම් පූර්ණ වශයෙන් භුක්ති විඳීමට හිමිකම් ලබති.

1.2 ඔවුන් විසින් භුක්ති විඳිය හැකි දේහපාලන අයිතිවාසිකම් වලට පහත සඳහන් කරුණු අයත් වේ.

1.2.1 දේශපාලන පක්ෂවල හෝ සමාගම්වල සාමාජිකත්වය ලබා ගැනීමට සහ එබඳු පක්ෂවල හෝ සමාගම්වල කටයුතු වලට සහභාගි වීමේ අයිතිය — *දේශපාලන පක්ෂයක හෝ සමාගමක සාමාජිකත්වය*

1.2.2 දේශපාලනමය ස්වභාවයකින් යුතු කරුණු සම්බන්ධයෙන් අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය (උදා: පුවත්පත් වලට ලිපි සැපයීම, පත්‍රිකා නිකුත් කිරීම, එබඳු විෂයයන් සම්බන්ධයෙන් පැවැත්වෙන රැස්වීම් ඇමතීම, ගුවන් විදුලි කතා පැවැත්වීම ආදිය). — *දේශපාලන අදහස් ප්‍රකාශ කිරීම*

1.2.3 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජ ව්‍යවස්ථාවේ 91(1)(d)(ix), 91(1)(d)(x) සහ 92(b) වගන්ති වලට, 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 3 (a) වගන්තියට සහ පළාත් පාලන ආයතන මැතිවරණ නියමාවලියේ 9 (vi) (a) සහ (b) යන වගන්ති වලට යටත්ව, ජනාධිපතිවරණයකට, පාර්ලිමේන්තු මැතිවරණයකට, පළාත් සභා මැතිවරණයකට හෝ පළාත් පාලන මැතිවරණයකට ඉදිරිපත් වීමේ අයිතිය. — *මැතිවරණයකට ඉදිරිපත් වීමේ අයිතිය*

සටහන (i) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 91(1)(d)(ix) සහ 91(1)(d)(x) යන වගන්තිවල මෙසේ සඳහන් වේ:

යම් තැනැත්තෙකු, ජනාධිපතිවරයෙකු ලෙස හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස තෝරා ගැනීමට හෝ පාර්ලිමේන්තුවේ අසුන් ගැනීමට සහ සිය ඡන්දය ප්‍රකාශ කිරීමට සුදුස්සෙකු නොවන්නේ;

<u>91(1)(d)(ix) වගන්තිය</u>

ඔහු, යම් රාජ්‍ය සංස්ථාවක වර්ෂ 1970 නොවැම්බර් මස 18 වන දින වන විට රු.7,200/- කට නො අඩු මූලික වැටුපක් හිමි වැටුප් පරිමාණයකට අයත් තනතුරක සේවය කරමින් සිටියේ ද, එම වැටුප් පරිමාණය පසුව සංශෝධනය වූයේ නම් එකී රු.7,200/- ට සමාන

මූලික වැටුපක් සහිත වැටුප් පරිමාණයකට පරිවර්තනය වූ විට.

91(1)(d)(x) වගන්තිය

1970 නොවැම්බර් මස 18 වන දිනට පසුව ඇති කරන ලද ධූරයක් වුවද, ධූරය ඇති කරන දිනයේ දී වැටුප් පරිමාණයෙහි ආරම්භක වැටුප් (IX) වන විෂයයෙහි සඳහන් ධූරයකට ඒ දිනයේ දී අදාල වැටුප් පරිමාණයෙහි ආරම්භක වැටුපට නැතහොත් ඉන් පසුව සිදු කරන ලද යම් වැටුප් පරිමාණ ප්‍රතිශෝධනයක් යටතේ, පළමු සඳහන් කළ ආරම්භක වැටුපට අනුරූප වෙනත් යම් වාර්ෂික වැටුප් ප්‍රමාණයකට නො අඩු වූ ද යම් ධූරයක් දරන්නා වූ රාජ්‍ය සංස්ථා නිලධරයින්

සටහන (ii) ව්‍යවස්ථාවේ 170 වැනි වගන්තිය: අර්ථ දැක්වීම

ව්‍යවස්ථාවේ 170 වැනි වගන්තිය: අර්ථ දැක්වීම

"රාජ්‍ය සංස්ථාව" යන්නෙන් සමාගම් ආඥාපනත යටතේ හැර, වෙනත් යම් ලිඛිත නීතියකින් හෝ ලිඛිත නීතියක් යටතේ, හෝ පිහිටුවන ලද හෝ පිහිටුවන ලබන්නාවූ ද, රජය විසින් ප්‍රදානයක් වශයෙන් හෝ ණයක් වශයෙන් නැතහොත් වෙනත් ආකාරයකින් මුළු අරමුදල හෝ මුළු ප්‍රාග්ධනය නැතහොත් අරමුදලෙන් කොටසක් සපයන්නා වූ සංස්ථාවක්, මණ්ඩලයක්, වෙනත් ආයතනයක් අදහස් වේ.

සටහන (iii) 1987 අංක 42 දරන පළාත් සභා පනතේ, 3 (a) කොටසට අනුව, යම් තැනැත්තෙකු ව්‍යවස්ථාවේ 91 (1) වගන්තියේ (a), (c), (d), (e), (f) සහ (g) ඡේදයන්හි සඳහන් පරිදි නුසුදුස්සෙකු වන්නේ නම්, ඔහු පළාත් සභාවකට තෝරා ගැනීමට, එහි අසුන් ගැනීමට හෝ ඡන්දය පාවිච්චි කිරීමට සුදුසුකම් නොලබනු ඇත.

සටහන (iv) පළාත් පාලන ආයතන නිලධාරීන් තෝරා ගැනීමේ නියමාවලියේ 9 (1) (vi) අනුව, යම් තැනැත්තෙකු, 2009 වසරේ ජනවාරි පළමුවැනිදාට පෙර ස්ථාපිත කරන ලද රු. 246,300/- ක මූලික වැටුප් පියවර සහිත වාර්ෂික වැටුපක් හිමි තනතුරක හෝ පසුව එම වැටුප් පියවරට අදාළව සංශෝධනය වූ සමාන වැටුප් පියවරක් හිමි වැටුප් පරිමාණයක වැටුප් ලබමින් සිටියේ නම් ද, ඔහු පළාත් පාලන ආයතනයකට තෝරා ගැනීමට, එහි අසුන් ගැනීමට හෝ ඡන්දය පාවිච්චි කිරීමට සුදුස්සෙකු නොවන්නේ ය.

1.3 මෙහි 1.2 උපඡේදයෙහි සඳහන් අයිතිවාසිකම් භුක්ති විඳිය යුත්තේ පහත සඳහන් කොන්දේසි වලට යටත්ව ය: කොන්දේසි වලට යටත් ව

1.3.1 දේශපාලන පක්ෂයක කටයුතු වලට සහභාගී වීම, දේශපාලන රැස්වීමක් ඇමතීම ආදිය සහ දේශපාලනමය ස්වභාවයක් ඇති කරුණු සඳහා මත ප්‍රකාශ කිරීම, යන අයිතිය භුක්ති විඳීමට අවසර ලැබෙනුයේ, සෑම අවස්ථාවකදී ම ප්‍රමුඛස්ථානය ලැබිය

රාජකාරියට අහිතකර ලෙස බල නොපාන පරිදි

යුතු කොමිෂන් සභාවේ/ උසස් අධ්‍යාපන ආයතනයක/ විද්‍යායතනයක කටයුතු වලට අදාළව එවැනි කරුණු දැක්වීම් අහිතකර ලෙස බල නොපාන ආකාරයට පමණකි. එවැනි දේශපාලන ස්වභාවයේ කටයුතු වලට සහභාගී වීම සඳහා, රාජකාරී අවශ්‍යතාවයන්ට යටත්ව, අදාල තැනැත්තාගේ නිවාඩු හිමිකම යොදා ගනිමින් නිවාඩු අනුමත කිරීමට, තම අභිමතය පරිදි නියමිත බලධාරීන් හට අවසරය ඇත.

1.3.2 (අ) ඉහත 1.2.3 උපපේදයෙහි සඳහන් නියමයන්ට අනුව සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජ ව්‍යවස්ථාවේ 91 (1) (d) (ix) සහ 91 (1) (d) (x) යන වගන්ති ප්‍රකාරව, ජනාධිපතිවරණයක්, පාර්ලිමේන්තු මැතිවරණයක් හෝ පළාත් සභා මැතිවරණයක් සඳහා නාම යෝජනා කිරීමට අදහස් කරන තැනැත්තෙකු විසින්, ඒ පිළිබඳව කොමිෂන් සභාවේ නම් එහි සභාපතිවරයාට, විශ්වවිද්‍යාලයක නම් එහි උපකුලපතිවරයාට, මණ්ඩපයක/ ආයතනයක නම් එකී මණ්ඩපය/ ආයතනය අනුබද්ධිතව/ අනුයුක්තව තිබෙන විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයා වෙත, විශ්වවිද්‍යාල විද්‍යායතනයක් නම් එහි අධ්‍යක්ෂවරයාට සහ උසස් අධ්‍යාපනය පිළිබඳ මධ්‍යස්ථානයක් නම් එහි අධ්‍යක්ෂවරයාට, එම මැතිවරණය සඳහා නාම යෝජනා කැඳවීමට අවම වශයෙන් දින දහයකට (10) පෙර ලිඛිතව දැනුම් දිය යුතු වේ. එසේ දැනුම් දුන් තැනැත්තා නාම යෝජනා කැඳවන දිනයට සතියකට පෙර සිට සහ අදාල මැතිවරණය පවත්වන දිනය දක්වා වැටුප් රහිත නිවාඩු මත තබනු ලැබේ.

නාම යෝජනා දීමට අදහස් කරන විට

(ආ) යම් තැනැත්තෙකු පළාත් පාලන මැතිවරණයකට තරඟ කිරීමට අපේක්ෂා කරන්නේ නම්, අදාල පරිදි ඔහු සේවය කරනුයේ කොමිෂන් සභාවේ නම් එහි සභාපතිවරයාට, විශ්වවිද්‍යාලයක නම් එහි උපකුලපතිවරයාට, මණ්ඩපයක/ ආයතනයක නම්, එම මණ්ඩපය/ ආයතනය අනුබද්ධිතව/ අනුයුක්තව තිබෙන විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයාට, විශ්වවිද්‍යාල විද්‍යායතනයක් නම් එහි අධ්‍යක්ෂවරයාට, උසස් අධ්‍යාපන මධ්‍යස්ථානයක්/ආයතනයක් නම් එහි අධ්‍යක්ෂවරයාට, තමන් එසේ තරඟ කිරීමට අදහස් කරන බව මැතිවරණයට නාම යෝජනා භාර ගැනීමට එක් දිනකට ප්‍රථමයෙන් ලිඛිතව දැනුම් දිය යුතු වේ.

පළාත් පාලන මැතිවරණය

එවැනි අවස්ථාවක දී, එම තැනැත්තාට පවත්නා වර්ෂයේ ඔහුගේ නිවාඩු තිබේ නම් එම නිවාඩු පාවිච්චි කිරීම සඳහා අවස්ථාව ලබා දෙනු ඇත. එසේ තමන්ගේ නිවාඩු නොමැති අවස්ථාවක දී, අදාල මැතිවරණය සඳහා නාම යෝජනා භාර ගන්නා දිනයේ සිට මැතිවරණය පවත්නා දිනය දක්වා කාලයට ඔහුට වැටුප් රහිත නිවාඩු ලබා දිය හැකි ය.

1.3.3 එම තැනැත්තා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපතිවරයා ලෙස හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස තෝරා පත් වුවහොත්, ඔහුට එසේ තෝරා පත් වූ දිනයේ සිට කොමිෂන් සභාවේ/ උසස් අධ්‍යාපන ආයතනයක/ විද්‍යායතනයක තමා දරන තනතුරෙන් ඉල්ලා අස්වීමට සිදු වේ.

**ජනාධිපතිවරයා ලෙස හෝ පාර්ලිමේන්තුවට තෝරා ගත් විට සේවයෙන් ඉල්ලා අස්විය යුතු ය.**

1.3.4 පළාත් පාලන ආයතනයකට තේරී පත් වූ පසු එහි රැස්වීම් වලට සහභාගි වීම සඳහා ලබා දෙන නිවාඩු:

**පළාත් පාලන ආයතනයක ට**

(අ) යම් තැනැත්තෙකු පළාත් පාලන ආයතනයක පුරපති/ සභාපති තනතුරක් සඳහා තෝරාගත් කළ, ඔහුට තම නිත්‍ය තනතුරේ සේවය කරන අතරතුර දී, අදාල පළාත් පාලන ආයතනයේ ඔහුව තෝරා ගත් තනතුරේ සේවය කිරීමට සහ එහි රැස්වීම් වලට සහභාගී වීම සඳහා මසකට දින අටක (08) වැටුප් සහිත නිවාඩු ලබා දෙනු ඇත.

**දින අටක (08) ක නිවාඩු**

යම් අවස්ථාවක දී, පළාත් පාලන ආයතනයක පුරපති/ සභාපති තනතුරක් සඳහා තෝරා පත්කර ගත් අයෙකු, ඉහත සඳහන් පරිදි නිවාඩු ලබා ගැනීමට අදහස් නොකරන කල්හි, ඒ වෙනුවට ඔහු විසින් වැටුප් රහිත නිවාඩු ලබා ගැනීම තෝරාගත් විට, එසේ නිවාඩු ලබා ගන්නා කාලය, පළාත් පාලන ආයතනයේ ලේකම්වරයා විසින් අදාල ආයතන ප්‍රධානියා වෙත එම පටන් ගැනීමේ දිනය සහ අවසන් වීමේ දිනය සමඟ දැනුම් දිය යුතු ය. එම දැන්වීම ලැබුනු පසු අදාල ආයතන ප්‍රධානියා විසින්, එකී බලධරයා හට දන්වා ඇති කාලය තුල වැටුප් රහිත නිවාඩු මත තබනු ඇත.

(ආ) ඔහු යම් පළාත් පාලන ආයතනයක් සඳහා තෝරා පත් කර ගත් විට සහ/හෝ ප්‍රාදේශීය සභාවක/ නගර සභාවක/ මහ නගර සභාවක උපනගරාධිපතිවරයෙකු/ උපසභාපතිවරයෙකු ලෙස පත් කල විට, එම ආයතනයේ රැස්වීම් වලට සහභාගී වීම සඳහා සේවයේ අවශ්‍යතාවයන්ට යටත්ව, ඔහුට දින හයක (06) වැටුප් සහිත නිවාඩු අනුමත කල යුතු ය.

**දින හයක (06) ක නිවාඩු**

1.3.5 යම් තැනැත්තෙකු පළාත් සභාවක මන්ත්‍රීවරයෙකු ලෙස තෝරා පත්වූ විට, ඔහුට පහත සඳහන් පහසුකම් අතුරින් එකක් භුක්ති විඳීමට අවස්ථාව ලැබේ;

**පළාත් සභාවක**

(අ) ඔහු, තමා තේරී පත් වූ පළාත් සභාවේ

මන්ත්‍රීවරයෙකු ලෙස සිටින තාක්කල්, එම පළාත් සභාවේ කටයුතු වල යෙදීම සඳහා වැටුප් රහිත නිවාඩු මත පූර්ණකාලීනව මුදාහරිනු ඇත.

(ආ) ඔහු, තමා පළාත් සභාවට තේරී පත් වූ පසු සේවයෙන් ඉවත් වූවාසේ සැලකිය යුතු ය.

1.3.6 ජාතික ලැයිස්තුවෙන් නාමයෝජනා කළ විට: — ජාතික ලැයිස්තුව

යම් තැනැත්තෙකු, මැතිවරණ කොමසාරිස්වරයා විසින්, ජාතික ලැයිස්තුවට ඇතුල් කළ විට, එම තැනැත්තා විසින් තමන් ජාතික ලැයිස්තුවට ඇතුලත් කර ඇති බව, අදාල පරිදි කොමිෂන් සභාවේ සභාපතිවරයාට/ උසස් අධ්‍යාපන ආයතනයේ/ විද්‍යායතනයේ ප්‍රධාන විධායක නිලධාරියා වෙත, එසේ ජාතික ලැයිස්තුවකට පත්වීම භාරගත් දිනයට පසු දිනය තුලදීම වාර්තා කළ යුතු වේ. එමෙන්ම, ඔහු පාර්ලිමේන්තු මන්ත්‍රී ධුරයක් සඳහා නාම යෝජනා කළ අවස්ථාවක දී, තමා කොමිෂන් සභාවේ/ උසස් අධ්‍යාපන ආයතනයක/ විද්‍යායතනයක දරන තනතුරෙන් එකී නාමයෝජනා ලැබූ දිනයේ සිටම ඉල්ලා අස්විය යුතු වේ.

## 2. ජනාධිපති ධුරයට, පාර්ලිමේන්තු මන්ත්‍රී ධුරයකට, පළාත් සභා හෝ පළාත් පාලන මන්ත්‍රී ධුරයකට තෝරා පත් කර ගැනීමට සුදුසුකම් නොලබන තැනැත්තන්

2.1 ජනාධිපති ධුරයට, පාර්ලිමේන්තු මන්ත්‍රී ධුරයකට, පළාත් සභා හෝ පළාත් පාලන මන්ත්‍රී ධුරයකට තෝරා පත්වීම වෙනුවෙන් ඉල්ලුම් කිරීමට සුදුසුකම් නො ලබන, කොමිෂන් සභාවේ/ උසස් අධ්‍යාපන ආයතනයක/ විද්‍යායතනයක සේවයේ නියුතු තැනැත්තන්, — නාම යෝජනා භාර දීමට පෙර ඉල්ලා අස්වීම

(මෙම පරිච්ඡේදයේ අදාළ සටහන් සහ 1.2.3 උපජේදය බලන්න)

තමන් එවැනි තනතුරකට පත්වීමට අදාළ ව කටයුතු සම්පාදනය කිරීමට, තම අපේක්ෂකත්වය ප්‍රවර්ධනය සඳහා අවශ්‍ය කටයුතුවල යෙදීමට, එවැනි අපේක්ෂකත්වය එය තුළින් තමන් ට ඇති ඉඩ ප්‍රස්ථාව පරීක්ෂා කිරීමට හෝ එවැනි මැතිවරණයක් සඳහා තම නාම යෝජනා භාර දීමට අදහස් කරන්නේ නම්, එසේ කටයුතු කිරීමට හෝ තමා වෙනුවෙන් එබඳු කටයුත්තක් කිරීම සඳහා බලය පවරා දීමක් කිරීමට හෝ පෙර V වන පරිච්ඡේදයේ 4 වැනි ජේදයෙහි දක්වා ඇති ආකාරයට, තමා සේවය කරමින් සිටින, කොමිෂන් සභාවෙන්/ උසස් අධ්‍යාපන ආයතනයෙන්/ විද්‍යායතනයෙන් ඉල්ලා අස්විය යුතු ය.

එවැනි තැනැත්තෙකු, තමන් සේවයෙන් ඉල්ලා අස්වීමට ප්‍රථමයෙන්, ආයතනයට ගෙවීමට ඇති සියලුම හිඟ මුදල් ගෙවා නිම කළ යුතු අතර, අදාල තැනැත්තා දැනට තමා අත්සන් කළ ගිවිසුමක් හෝ ඇපබැඳුම්කරයක් අනුව අනිවාර්ය සේවා කාලයක් ගෙවමින් සිටී නම්, එකී ගිවිසුමට සහ ඇපබැඳුම්කරයට අදාල මුදල් ද ගෙවා තමා වෙත ඇති බැඳීම් වලින් නිදහස් විය යුතු වේ.

2.2 එම තැනැත්තා, පසුව කොමිෂන් සභාවේ/ උසස් අධ්‍යාපන ආයතනයක/ විද්‍යායතනයක නැවත සේවයෙහි පිහිටුවන ලෙසට ඉල්ලා සිටිය හැකි අතර, ඔහු දරමින් සිටි තනතුර තවමත් පුරප්පාඩුව පවතින්නේ නම්, සහ ඔහු සේවයේ යෙදී සිටි කොමිෂන් සභාවේ සභාපතිවරයා/ විශ්වවිද්‍යාලයක හෝ එම විශ්වවිද්‍යාලයට අනුබද්ධිත/අනුයුක්තව ඇති මණ්ඩපයක/ ආයතනයක වන කල්හි එහි උපකුලපතිවරයා/ විශ්වවිද්‍යාල විද්‍යායතනයක අධ්‍යක්ෂකවරයා හෝ උසස් අධ්‍යාපනය පිළිබඳව ආයතනයක/ මධ්‍යස්ථානයක අධ්‍යක්ෂකවරයා එකඟවන්නේ නම්, අදාල බඳවා ගැනීමේ පරිපාටියට පිටතින් නැවත පත්කිරීමට කටයුතු කළ හැකි ය.

තනතුරට නැවත පත් කිරීම

2.3 එසේ යම් තැනැත්තෙකු ඉහත 2.2 උපජේදයට අනුව නැවත සේවයට පත්කිරීමට එකඟ වූ විට, එම නැවත පත් කිරීම සඳහා කොමිෂන් සභාවේ සේවකයෙකු නම් කොමිෂන් සභාවේ ද, උසස් අධ්‍යාපන ආයතනයක/ විද්‍යායතනයක සේවකයෙකු නම්, එම උසස් අධ්‍යාපන ආයතනයේ පාලක බල මණ්ඩලයේ ද පූර්ව අනුමැතිය ලබා ගත යුතු වේ.

නැවත පත් කිරීමට පූර්ව අනුමැතිය

2.4 ඉහත 2.1 උපජේදයෙහි සඳහන් විධිවිධානයන්ට පටහැනිව ක්‍රියා කරනු ලබන යම් තැනැත්තෙකු වේ නම්, ඔහුට විරුද්ධව විනයානුකූලව කටයුතු කරනු ඇත.

විනයානුකූල ක්‍රියාමාර්ග

**3. දේශපාලන රැස්වීම් සහ ඡන්ද ආයාචනයෙහි යෙදීම (Canvasing ) ආදිය**

3.1 කොමිෂන් සභා පරිශ්‍රයේ හෝ උසස් අධ්‍යාපන ආයතනයක/ විද්‍යායතනයක පරිශ්‍රයන්හි හෝ එම ස්ථානයන්හි ගොඩනැඟිල්ලක් තුළ හෝ සේවා ස්ථානයක් තුළ කිසිඳු දේශපාලන රැස්වීමක් පැවැත්වීම නොකළ යුතු ය.

(මෙම රීතිය, XV වන පරිච්ජේදයේ 4 වැනි ජේදයේ සඳහන් වෘත්තීය සංගම් රැස්වීම් පැවැත්වීමට බල නොපානු ඇත)

උසස් අධ්‍යාපන ආයතනය පරිශ්‍රයන්හි සහ ගොඩනැඟිලි තුළ නොහැකි ය

3.2 කිසිදු දේශපාලනමය පෝස්ටර් හෝ වෙනත් දේශපාලනයට සම්බන්ධ සළකුණු කොමිෂන් සභා/ උසස් අධ්‍යාපන ආයතන/ විද්‍යායතන පරිශ්‍රයක් තුළ ප්‍රදර්ශනය නොකළ යුතු ය.

පෝස්ටර් ආදිය

3.3 ජනාධිපතිවරණයකට/පාර්ලිමේන්තු මැතිවරණයකට/පළාත් සභා හෝ පළාත් පාලන මැතිවරණයකට ඉදිරිපත් වී ඇති අපේක්ෂකයෙකු වෙනුවෙන්, කොමිෂන් සභාවේ/ උසස් අධ්‍යාපන ආයතනයක/ විද්‍යායතනයක භූමියේ, ගොඩනැඟිල්ලක හෝ සේවා ස්ථානයක රාජකාරී වේලාව තුළ හෝ අධ්‍යාපන කටයුතු පැවැත්වෙන වේලාවන්හි දී එම මැතිවරණයට අදාල පෝස්ටර්/ පත්‍රිකා බෙදා හැරීම නො කළ යුතු අතර, එකී අපේක්ෂකයන් වෙනුවෙන් ඡන්ද ආයාචනයෙහි ද නො යෙදිය යුතු ය.

ඡන්ද ආයාචනය (Canvasing)

**4. පිළිගත් දේශපාලන පක්ෂයක මධ්‍යම කාරක සභාවන්හි නිලතල උසුලන තැනැත්තන්ගේ මාරුකිරීම් වලදී ලබා දෙන අනුග්‍රහ**

4.1 කොමිෂන් සභාවේ/ උසස් අධ්‍යාපන ආයතනයක/ විද්‍යායතනයක සේවයේ නියුතු, පිළිගත් දේශපාලන පක්ෂයක මධ්‍යම කාරක සභාවේ සභාපති/ උප සභාපති/ ලේකම්/ උප ලේකම්/

යම් නිලතල දරන්නන්

භාණ්ඩාගාරික යන තනතුරු දරන සේවකයින් හට, අදාල මධ්‍යම කාරක සභා ප්‍රධාන කාර්යාලයට නුදුරින් පිහිටි කොමිෂන් සභාවේ හෝ උසස් අධ්‍යාපන ආයතනයක/ විද්‍යායතනයක සේවය කිරීමට පහසුකම් සලසා දිය යුතු අතර, එසේ කටයුතු කිරීමේ දී අදාල පරිදි කොමිෂන් සභාවේ/ උසස් අධ්‍යාපන ආයතනයන්හි/ විද්‍යායතනයන්හි අවශ්‍යතාවයන්ට සහ විනය අවශ්‍යතාවයන්ට යටත්ව කටයුතු කළ යුතු වේ.

4.2 යම් තැනැත්තකු, එකී මධ්‍යම කමිටුවේ තනතුර උසුලනතාක්, සාමාන්‍ය නිවාඩු රීතීන් හට යටත් නොවේ. එබඳු තැනැත්තෙකු තමා මධ්‍යම කමිටුවේ උසුලන තනතුරෙන් ඉවත් වූ විට හෝ ඉහළ තනතුරකට, පංතියකට හෝ ශ්‍රේණියකට උසස් වූ විට හෝ කොමිෂන් සභාවේ/ උසස් අධ්‍යාපන ආයතනයක/ විද්‍යායතනයක 1970 නොවැම්බර් මස 01 වැනි දිනට රු. 7,200/- ක මූලික වැටුපක් සහිත වැටුප් පරිමාණයකට හෝ වර්තමානයේ එම වැටුප් පරිමාණයකට සමාන තනතුරකට පත් කළ විට දී හෝ සාමාන්‍ය මාරු කිරීමේ නියෝගයක් මත ස්ථාන මාරු කිරීම් සඳහා යටත් වනු ඇත. — තනතුර උසුලන කාලය තුල

4.3 මෙම අනුග්‍රහය ලබා ගැනීමට අපේක්ෂා කරන තැනැත්තෙකු, ඒ සඳහා අදාල පරිදි තමන් සේවය කරන කොමිෂන් සභාවේ සභාපතිවරයාට හෝ උසස් අධ්‍යාපන ආයතනයේ ප්‍රධාන විධායක නිලධරයාට ඉල්ලීමක් ඉදිරිපත් කළ යුතු ය. මණ්ඩපයක සේවකයෙකු තම මණ්ඩපාධිපතිවරයා මඟින් අනුබද්ධ විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයාට සහ අනුයුක්ත ආයතනයක නම්, එම ආයතනයේ අධ්‍යක්ෂකවරයා මඟින්, අනුයුක්ත විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයාට එම ඉල්ලීම ඉදිරිපත් කළ යුතු වේ. — අනුග්‍රහය ලබා ගැනීමට අයදුම් කිරීම

4.3.1 එම අයදුම් පත්‍රයේ මධ්‍යම කමිටුමේ තමන් දරන නිලයේ නාමය, දේශපාලන පක්ෂයේ නම සහ එහි ප්‍රධාන කාර්යාලයේ ලිපිනය ද සඳහන් කොට පක්ෂයේ ලේකම්වරයා මඟින් සහතික කරවා ගත යුතු ය. එමෙන්ම, තමා සේවය කිරීමට මනාපය දක්වන ස්ථානය ද; එනම්, කොමිෂන් සභාවට ද, නැතහොත් යම් උසස් අධ්‍යාපන ආයතනයක්/ විද්‍යායතනයක් වෙත ද යන්නද සඳහන් කළ යුතු වේ.

4.4 "පිළිගත් දේශපාලන පක්ෂය" යන්නෙන් අදහස් වනුයේ, වෙනත් ආකාරයකින් විධිවිධාන යොදා ඇත්නම් මිස මැතිවරණ කොමසාරිස්වරයා විසින් පිළිගනු ලැබූ දේශපාලන පක්ෂයකි. — පිළිගත් දේශපාලන පක්ෂය

## 5. දේශපාලන පක්ෂයක සාමාජිකත්වය

5.1 රාජ්‍ය සේවයෙන් හෝ පළාත් පාලන සේවයෙන් ද්විතීයන පදනම මත සේවයට පැමිණ සිටින්නන් හැර, කොමිෂන් සභාවේ/ උසස් අධ්‍යාපන ආයතනයක/ විද්‍යායතනයක සේවයේ නියුතු තැනැත්තන්, යම් දේශපාලන පක්ෂයක හෝ, වරිපනම් ගෙවන්නන්ගේ සංගමයක හෝ බදු ගෙවන්නන්ගේ සංගමයක හෝ වෙනත් එබඳු සංගමයක සාමාජිකත්වය හෝ තනතුරක් හෝ දැරිය හැකි අතර, එබඳු සංගම්වල නීත්‍යානුකූල කටයුතු වලට සහභාගී විය හැකි ය. — දේශපාලන සංගම්

5.1.1 කෙසේ වෙතත්, ඔවුන් හට, කොමිෂන් සභාවේ/ උසස් අධ්‍යාපන ආයතනයක/ විද්‍යායතනයක පරිශ්‍රය, ගොඩනැඟිලි හෝ සේවා ස්ථාන එබඳු සංගමයක රැස්වීම්, සාකච්ඡා පැවැත්වීමට හෝ වෙනත් කටයුත්තක් සඳහා යොදා ගැනීම තහනම් වේ.

ආයතන පරිශ්‍රය භාවිතා නොකළ යුතු ය.

## 6. වෘත්තීය සංගමයක සාමාජිකත්වය

6.1 විශ්වවිද්‍යාල පද්ධතියේ සේවයේ යෙදී සිටින තැනැත්තන් වෘත්තීය සංගම් ආඥාපනතට අනුව ඔවුනොවුන් සම්බන්ධ වී වෘත්තීය සංගමයක් පිහිටුවා ගත හැකි අතර, දැනටමත් පිහිටුවා ඇති වෘත්තීය සංගමයකට එකතු වීමට ද හැකි ය. එවැනි වෘත්තීය සංගමයන් තම සාමාජිකයන් වෙනුවෙන් කොමිෂන් සභාවට/ උසස් අධ්‍යාපන ආයතනයකට/ විද්‍යායතනයකට යෝජනා ඉදිරිපත් කිරීමට හැකි වන පරිදි, වෘත්තීය සංගම් රෙජිස්ට්‍රාර්වරයා වෙත ලියා පදිංචි වීමට කටයුතු කළ යුතු ය.

වෘත්තීය සංගමය

කෙසේ වුව ද, වෘත්තීය සංගම් ආඥා පනතේ සහ එහි සංශෝධනයන් හි අඩංගු විධිවිධානයන්ට අනුව මිස, කොමිෂන් සභාවේ/ උසස් අධ්‍යාපන ආයතනයන/ විද්‍යායතනයක සේවයේ නොමැති තැනැත්තෙකු හට, එබඳු වෘත්තීය සංගමයක සාමාජිකයෙකු වීමට හෝ අනුශාසකවරයෙකු ලෙස පත් කරනු ලැබීමට හෝ තනතුරක් දැරීමට හෝ අවසර නොමැත.

6.2 කොමිෂන් සභාවේ හෝ උසස් අධ්‍යාපන ආයතනයක නිලධරයන් හට, වෘත්තීය සංගම් විසින් නියෝජන ඉදිරිපත් කරන අවස්ථාවන්හි දී, එම කරුණු සලකා බැලීමේ දී ඇති වන ප්‍රමාදයන් වළක්වා ගැනීම පිණිස, මෙම උපජේදයෙහි සඳහන් ක්‍රමවේදය අනුගමනය කළ යුතු ය.

වෘත්තීය සංගමයක් විසින් කරුණු ඉදිරිපත් කිරීම

(අ) යම් නියෝජනයක් ඉදිරිපත් කරන විට, එම සංගමයේ සභාපතිවරයාගේ හෝ ලේකම්වරයාගේ අත්සන යටතේ ඉදිරිපත් කළ යුතු වේ. සංගමයක උප සභාපතිවරයෙකු හෝ උප ලේකම්වරයෙකු විසින් ඉදිරිපත් කරනු ලබන නියෝජන බාර ගනු ලබන්නේ, සභාපතිවරයා සහ ලේකම්වරයා යන දෙදෙනාම යම් හේතුවක් මත නොමැති අවස්ථාවන්හි දී සහ එම නියෝජනය ඉතා හදිසි අවධානයට යොමු විය යුතු එකක් නම් පමණකි.

ලිඛිතව කරුණු දැක්විය යුතු ය

(ආ) ඉදිරිපත් කරනු ලබන නියෝජනය, කොමිෂන් සභා කාර්යාලයේ දී හෝ උසස් අධ්‍යාපන ආයතනයක දී පැන නැඟුනු ගැටලුවක් සම්බන්ධයෙන් නම්, එය උචිත පරිදි කොමිෂන් සභාවේ ලේකම්වරයාට/ විශ්වවිද්‍යාලයක උපකුලපතිවරයාට/ මණ්ඩපයක මණ්ඩාධිපතිවරයාට/ විශ්වවිද්‍යාල විද්‍යායතනයක අධ්‍යක්ෂකවරයාට/ ආයතනයක අධ්‍යක්ෂකවරයාට/ උසස් අධ්‍යාපන මධ්‍යස්ථානයක අධ්‍යක්ෂකවරයාට ඉදිරිපත් කළ යුතු ය. එවැනි අවස්ථාවක දී, ගැටලුව පැහැදිලිව සඳහන් කළ යුතු අතර, එයට පාදක වූ පසුබිම කෙටියෙන් විස්තර කොට, බලාපොරොත්තු වන විසඳුමද දැක්විය යුතු වේ.

කොමිෂන් සභාවේ/ උසස් අධ්‍යාපන ආයතනයක/ විද්‍යායතනයක පැන නඟින ගැටලු

(ඇ) මණ්ඩපයක දී හෝ ආයතනයක දී නම්, එහි මතු වී ඇති ගැටලුව වෘත්තීය සංගමය සමඟ සාර්ථක ලෙස නිරාකරණය කර ගැනීමට නොහැකි වන විට, එකී මණ්ඩපය අනුබද්ධව පවතින සහ ආයතනයක් නම් එය අනුයුක්තව පවතින විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයා වෙත, සම්පූර්ණ වාර්තාවක්, තම යෝජනාද සමඟ එකී මණ්ඩපයක මණ්ඩපාධිපතිවරයා විසින් හෝ අධ්‍යක්ෂකවරයාගෙන් ලැබෙන තෙක්, අදාල නියෝජන සම්බන්ධයෙන් උපකුලපතිවරයා පියවර නොගනු ඇත.

මණ්ඩාධිපතිවරයා ගේ/ අධ්‍යක්ෂකවරයා ගේ සම්පූර්ණ වාර්තාව

(ඈ) අදාල ගැටලුව සාර්ථක ලෙස විසඳීමට උපකුලපතිවරයා අසමත් වන්නේ නම්, ඔහු විසින් එය ඉදිරිපත් කොට ඇති සම්පූර්ණ වාර්තාවද සමඟ විශ්වවිද්‍යාලයේ පාලක සභාව වෙත යොමු කරනු ඇත.

පූර්ණ බලතල

(ඉ) කොමිෂන් සභා කාර්යාලයට අදාල, යම් ගැටලුවක් කොමිෂන් සභාවේ සභාපතිවරයා විමසීමෙන් අනතුරුව, එහි ලේකම්වරයා විසින් විසඳීමට අපොහොසත්වන අවස්ථාවක දී, එම ගැටලුව කොමිෂන් සභාව වෙත යොමු කළ යුතු ය.

කොමිෂන් සභාවට දැන්වීම